**දැරණියගල ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දැරණියගල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දැරණියගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දීර්ඝ කාලයක් තිස්සේ වත්කම් සහ වගකීම් ශේෂ 04 ක හා ඊට අදාළ ලේඛනවල ශේෂ අතර පැවැති වෙනස විධිමත් අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට ගලපා තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල හා සේවක ණය ගිණුම රු.637,487ක් වැඩියෙන්ද, තැන්පත් ගිණුම හා අතිකාරම් ගිණුම රු.3,657,571ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එකඟ වී ඇති අතර මෙම වෙනසට හේතුව සොයාගත නොහැකි බැවින් ලේඛනවල ශේෂය ජර්නල් සටහන් මඟින් ගැළපීමට ලේකම් තීරණය මඟින් අනුමැතිය ලබාගෙන ඇති බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ස්ථාවර වත්කම් ගිණුම් ශේෂ 2 ක පැවැති ස්ථාවර වත්කම් ලේඛන සමග වූ රු.805,299ක වෙනස විධිමත් අනුමැතියකින් තොරව ගලපා තිබුණි. | එකඟ වී ඇති අතර ලේකම් තීරණ අංක 09 මඟින් අනුමැතිය ලබාගෙන ඇති බව. | - එම - |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 03ක ශේෂය, උපලේඛන හා සැසඳීමේදී රු.47,882,571ක වෙනසක් පැවැතිණි. | එකග වී තිබුණි. | වෙනස සැසඳිය යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.11,947,312ක මූල්‍ය නොවන වත්කම් හා මිශ්‍ර තැන්පතු සඳහා උපලේඛන ඉදිරිපත් නොවුණි. | එකග වී තිබුණි. | අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.5. අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වාහන 09ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | එකඟ වී ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,705,276 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,805,812 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 13,989,745 | 14,934,636 | 11,209,907 | 3,724,728 | 8,223,845 | 9,169,126 | 8,665,439 | 2,421,200 |
| කුලී | 7,789,325 | 8,741,456 | 8,654,402 | 87,053 | 7,246,849 | 8,152,080 | 8,281,477 | 63,684 |
| බලපත්‍ර ගාස්තු | 1,140,100 | 1,526,275 | 1,485,775 | 40,500 | 790,100 | 1,264,476 | 1,305,476 | 9,100 |
| වෙනත් ආදායම් | 3,849,000 | 6,330,632 | 5,547,729 | 782,903 | 2,553,500 | 5,007,633 | 4,856,840 | 711,166 |
| එකතුව | 26,768,170 | 31,532,999 | 26,897,813 | 4,635,184 | 18,814,294 | 23,593,315 | 23,109,232 | 3,205,150 |

#### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට රු.296,233 ක හිඟහිටි අක්කර බදු ශේෂය තුළ වසර 05 ට වැඩි රු.255,363 ක ශේෂ පැවතුණි | එකඟ වී ඇති බවත් හිඟ මුදල අය කිරීමට කටයුතු කරන බව. | ආදායම් නොපමාව අය කරගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපාර සමීක්ෂණය අනුව ව්‍යාපාර 489 ක් හඳුනාගෙන තිබුණද, ව්‍යාපාර බදු ලේඛනය අනුව ආයතන 984 කින් බදු මුදල් ලැබී තිබුණි. ඒ අනුව ව්‍යාපාර ඒකක 495 ක් හඳුනා නොගැනීම නිසා ව්‍යාපාර සමීක්ෂණයේ නිවැරදිතාව ප්‍රශ්ණගත විය. | එකඟ වී ඇති බව. | ව්‍යාපාර සමීක්ෂණය නිවැරදිව සිදු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 වර්ෂයේදී ජීව වායු ඒකකයක් ඉදිකර තිබුණ ද, ඉන් නිපදවන ජීව වායු ඉතා සුළු ප්‍රමාණයක් පමණක් භාවිතයට ගෙන වැඩි ප්‍රමාණයක් පුළුස්සා විනාශ කරමින් පවතී. මෙම සියලු ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද රු.8,703,078 ක් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | පුළුස්සනු ලබන වායුව භාවිතා කර ඉදිරියේදී විජලන යන්ත්‍රයක් සවිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. | ජීව වායු ඒකකය කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.33,861,754 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ වසර 05 ට වැඩි රු.24,396,200 ක ශේෂ පැවතුණි. | එකඟ වී ඇති බව. | ශේෂ නිරවුල් කරගත යුතු වේ. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.21,148,475 ක් වූ ණයගැති ශේෂය තුළ වසර 05ට වැඩි රු.2,949,478 ක ශේෂ පැවතුණි. | - එම - | - එම - |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කැබ් රථයකට 2023 වර්ෂයේ සිදුකළ රු.313,800 ක අලුත්වැඩියාවක් සඳහා ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 ප්‍රකාරව ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කර ඇති බව. | ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කළ යුතු වේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත සේවක සංඛ්‍යාව 65 කින් පුරප්පාඩු 17 ක් හා 04 දෙනෙකුගේ අතිරික්තයක් පැවැතිණි. ඒ හැර, ශ්‍රම පදනම මත තනතුරු 19 ක් ද, අනියම් පදනම මත එක් අයෙකු ද බඳවාගෙන තිබුණි. එමෙන්ම, 13 දෙනෙකු දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර තිබුණු අතර 02 දෙනෙකු කිසිදු අනුමැතියක් රහිතව සේවයේ යොදවා තිබුණි. | බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක පත්වීම් අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා පත්කර ඇත. | නව තනතුරු අනුමත කරගත යුතු වේ. |
| (ආ) | අනියම් හා ශ්‍රම පදනමට බඳවාගෙන තිබුණු 23 දෙනෙකුගෙන් 08 දෙනෙකු තම ස්ථිර තනතුරට අදාළ නොවන වෙනත් තනතුරුවල සේවයේ නියුක්ත කර තිබුණි. | සේවා ව්‍යවස්ථා සංශෝධනය කිරීමේදි කම්කරු තනතුරු සියල්ල වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර වෙත අන්තර්ග්‍රහණය කර ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර බඳවා ගත් අය නියමිත කාර්යයන්හි පිහිටු විය යුතු වේ. |
| (ඇ) | වසර 02 සිට වසර 24 දක්වා කාලයක් ගත වී තිබුණු නිලධාරීන් 11 දෙනකුගෙන් අයවියයුතු රු. 358,597 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ද අයකර නොතිබුණි. | එකඟ වී ඇති බව. | හිග සේවක ණය ශේෂය අය කළ යුතු වේ. |